ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා පොලිස් නිලධාරීන් සඳහා වන මාර්ගෝපදේශය

**හැඳින්වීම**

සියලුම මනුෂ්‍යයන් නිදහස්ව උපත ලබා ඇත. ගරුත්වයෙන් හා අයිතිවාසිකම්වලින් සමාන වෙති.සියලුම ලිංගික දිශානතීන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතා ඇති සියලු මනුෂ්‍යයන්ටද මානව හිමිකම්වල පූර්ණ භුක්තිය විඳීමට හිමිකම් ඇත[1].

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද නීතිය ඉදිරියේ සියලු දෙනා සමාන බවත්, නීතියේ සමාන ආරක්ෂාවක් ඇති බවත් පිළිගනී. ආන්තීකරණයට ලක්කරනු ලැබූ පුද්ගල කණ්ඩායම් අතර සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව එක් කණ්ඩායමකි. සංක්‍රාන්ති සමාජභාවීය යනු උපතේදී ඔවුන්ට පවරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවයට පිළිබඳ අනන්‍යතාවයට නොගැලපෙන විවිධ පුද්ගලයින් සමූහයක් වෙනුවෙන් භාවිතා කරන පොදු පදයකි. එමනිසා, පිරිමි පුද්ගලයෙකු තම ජීව විද්‍යාත්මක ලිංගිකත්වය ගැහැණු ලෙස (පිරිමි සිට ගැහැණු – MTF) වෙනස් කිරීමටත්, ඒ ආකාරයෙන්ම, ගැහැණු පුද්ගලයෙකු තම ජීව විද්‍යාත්මක ලිංගිකත්වය පිරිමියෙකු ලෙස (ගැහැණු සිට පිරිමි දක්වා - FTM) වෙනස් කිරීමටත්, දිගු හා ඇඩි ක්‍රියාවලියකින් පසු කැමැති වෙති. මෙම ක්‍රියාවලිය සංක්‍රාන්ති ක්‍රියාවලියක් ලෙස අර්ථ දැක්විය හැක.

අන්තර්ජාතික මනෝවිද්‍යාඥයින්ගේ සංගමය, ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි වෛද්‍ය සංවිධාන සහ වෘත්තිකයන් මෙය රෝගී තත්වයක් නොවන බව ඔප්පු කර ඇත. මෙම ආන්තික කණ්ඩායම මානව සම්භවය ආරම්භයේ සිටම අප අතර ජීවත් වන අතර, විවිධ සමාජ සාධක නිසා තම අනන්‍යතාවය සඟවාගෙන නොයෙකුත් කැපකිරීම් කරමින් ජීවත් වෙති.

සමහර සංක්‍රාන්ති සමාජභාවීය ඔවුන්ගේ ප්‍රශ්නගත අනන්‍යතාවය සහ මානසික ආතතිය හේතුවෙන් පැමිණිලි කරති. තවද, ඔවුන් සමාජ අපකීර්තියට, ලිංගික හිරිහැරවලට, රැකියා සඳහා බඳවා ගැනීම්වලදී වෙනස් කොට සැලකීම්වලට ලක්වීම සහ පවුලෙන් නෙරපා හැරීම් ආදියට මුහුණ දෙයි.

මේ නිසා සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව මානසික ආතතියට හා සියදිවි නසාගැනීමේ සිතුවිලි වලට ගොදුරු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සියදිවි නසා ගැනීමට උත්සාහ කරති. එබැවින්, සියලුම පුරවැසියන් ඔවුන්ගේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හඳුනාගත යුතුය.වෙනස්කොට සැලකීම් නොවන

[1] යෝග්‍යකාර්තා මූලධර්මවල 1 වන මූලධර්මය

බවට සහතික විය යුතුය,පුද්ගලික ආරක්ෂාව සහ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය සහතික කළ යුතුය.

සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව පැහැදිලිවම ප්‍රකාශ කරන්නේ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් තම ගැටළු පිළිබඳව දැනුවත් කළ යුතු එක් කණ්ඩායමක් බවයි. පොලිස් නිලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ලෙස, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ අනන්‍යතාවට ගරු කිරීම වෙනස් කොට සැලකීම් නොකිරීම, පුද්ගලික ආරක්ෂාව සහ පෞද්ගලිකත්වයට ඇති අයිතියට ගරුකිරීම, සිය රාජකාරි ඉටු කිරීමේදී සහතික කිරීමේ වගකීම ඔවුනට ඇත. එසේම සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ට එරෙහිව අපරාධ ක්‍රියාවන් සිදු වුවහොත් ඔවුන් ආරක්ෂා කිරීමට පොලිසිය ක්‍රියාශීලීව මැදිහත් විය යුතුය.

සියලුම පුරවැසියන් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ට වෙනස් කොට සැලකීමකින් තොරව සමානව සැලකිය යුතු අතර, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ සමාජ නිදහස සමාන ලෙස සුරක්ෂිත කිරීමට ඔවුන්ට සහාය විය යුතුය.

## මාර්ගෝපදේශ

### මාර්ගෝපදේශය 01: නීතිය ඉදිරියේ පිළිගැනීමට ඇති අයිතිය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.1 වගන්තිය යටතේ ප්‍රකාශ කර ඇති පරිදි "නීතිය ඉදිරියෙහි සියල්ලෝම සමාන වන අතර නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුයිය" යන ව්‍යවස්ථාමය සහතිකය සලකා බැලීම සඳහා පොලිස් නිලධාරීන් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්, ඔවුන්ගේ අනන්‍යතාව සහ සංක්‍රාන්ති සමාජභාවීය ක්‍රියාවලිය හඳුනාගත යුතුය.

විවිධ අංශවල සිටින සියලුම පොලිස් නිලධාරීන් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් සහ සංක්‍රාන්ති ලිංගික ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් විය යුතු අතර යෝග්‍යකාර්තා මූලධර්මවල දක්වා ඇති ඔවුන්ගේ විශ්වීය වශයෙන් පිළිගත් අයිතිවාසිකම් සහ නිදහසට ගරු කළ යුතුය[2].

### මාර්ගෝපදේශය 02: සමානාත්මතාවයට සහ වෙනස්කොට නොසැලකීමට ඇති අයිතිය

අ) පොලිස් නිලධාරීන් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ ලිංගික අනන්‍යතාවය මත වෙනස් කොට සැලකීම නොකළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.2 වගන්තිය යටතේ "කිසිවෙකු ජාතිය, වාර්ගිකත්වය, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ එවැනි පදනමක් මත වෙනස් කොට සැලකීම නොකළ යුතුය". පොලිස් නිලධාරීන් මෙය පිළිනොපදින්නේ නම්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.2 වගන්තිය උල්ලංඝනය කිරීමකි.

ආ) ඊට අමතරව, අසමාන ලෙස සැලකීම, නොකරහැරීම, නොසැලකිල්ල, අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීම, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ අවශ්‍යතා කෙරෙහි සංවේදී නොවීම සහ එවැනි ඕනෑම ආකාරයක ක්‍රියාවක් මගින් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත

[2] මූලධර්මය 01, මූලධර්මය 03

ප්‍රවේශයට බාධාකිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.1 වගන්තිය උල්ලංඝනය කිරීමක් වනු ඇත.

**මාර්ගෝපදේශය 03: වධහිංසා සහ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් වලින් නිදහස් වීමේ අයිතිය**

අ) සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය හේතුවෙන් පොලිස් ස්ථානවල පවා ශාරීරික ප්‍රහාර, වාචික අපයෝජන, බ්ලැක්මේල් සහ ලිංගික හිරිහැර කිරීම් හෝ වෙනත් ආකාරවල ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ දෙයි. සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් හට නිලධාරීන් පහත් වචනයෙන් කතා කරන්නේ නම්, එය සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ට ශාරීරික හා මානසික වධහිංසා පමුණුවීමක්, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමක් හෝ දඬුවමක් ලෙස සැලකිය යුතුය. එබැවින් මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය සහ පවතින අනෙකුත් නීති උල්ලංඝනය කිරීමකි.

ආ) පොලිස් නිලධාරීන්, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ ශරීරය පරීක්ෂා කිරීමේදී ඔවුන්ගේ ලිංගභේදය හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුයි. සැක කිරීමට සාධාරණ හේතු තිබේ නම්, ඔවුන් පළමුව පුද්ගලයාගේ සිරුර පරීක්ෂා කිරීමට පෙර හැඳුනුම්පත හෝ වෙනත් වලංගු ලියවිල්ලක් පරීක්ෂා කළ යුතුය. ඔහුට/ඇයට නිසි ගෞරවයෙන් සැලකීම, එම පුද්ගලයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සහ ගරු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම පුද්ගලයන්ගේ ශරීර සෝදිසි කිරීම් සිදු කරන ආකාරය පිළිබඳව පොලිසිය විසින් මාර්ගෝපදේශ සකස් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය. සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙකු යනු තවත් පුද්ගලයෙකු පමණක් වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සෑම පුද්ගලයෙකුටම හිමිවන සියලුම අයිතීන් සඳහා ඔවුන් හිමිකම් ලබයි.

**මාර්ගෝපදේශ 04: පුද්ගලික ආරක්ෂාවට ඇති අයිතිය**

අ) සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් පොදු ස්ථානවල අපකීර්තියට, වෙනස් කොට සැලකීමට සහ ප්‍රචණ්ඩත්වයට, වාචික නොවන අභිනයන්, වාචික අපයෝජනයන්, තර්ජන සහ ශාරීරික ප්‍රහාරයන්වලට මුහුණ දෙති. මෙම තත්ත්වයන් තුළ පොලිසිය ක්‍රියාශීලීව මැදිහත් විය යුතු අතර, එම තත්ත්වයන් මඟහරවා ගත යුතු ය. එසේම එම අයිතිවාසිකම් කඩ කරන පුද්ගලයන්ට එරෙහිව සුදුසු නීතිමය පියවර ගත යුතුය.

ආ) එවැනි දුක්ගැනවිලි සඳහා පොලිස් නිලධාරීන් විසින් නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම, මගහැරීම හෝ ප්‍රමාද කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.1 වගන්තිය උල්ලංඝනය කිරීමක් වනු ඇත.

සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් හරස් විලාසිතා කිරීම- (Cross Dress), දණ්ඩ නීති සංග්‍රහයේ 399 වැනි වගන්තිය යටතේ අපරාධයක් බවට පත් කිරීමට පොලිසිය නැඹුරු වේ - "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම". එසේම, පොලිසිය සාමාන්‍යයෙන් මෙම හරස් විලාසිතාවෙන්(Cross Dressing) සැරසී සිටින පුද්ගලයින් ලිංගික ශ්‍රමිකයන් ලෙස වැරදි ලෙස විනිශ්චය කරයි. හරස් විලාසිතා කිරීම- (Cross Dress) සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් අනෙකකු ලෙස පෙනී සිටීමක් ලෙස සැලකිය නොහැකි අතර, ඔවුන් ලිංගික ශ්‍රමිකයන් ලෙස අගතියට පත් නොකළ යුතුය. අපරාධ නීතිය වැරදි ලෙස භාවිතා කිරීම බරපතල ප්‍රතිවිපාක ඇති කර. මෙම ප්‍රතිවිපාක පිළිබඳව පොලිසියට උපදෙස් දිය යුතු අතර, නියමිත රෙගුලාසිවලට අනුකූල නොවන පොලිස් නිලධාරීන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගත යුතුය.

**මාර්ගෝපදේශ 05: අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබාගැනීම් වලින් නිදහස් වීමේ අයිතිය**

සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් බොහෝ විට පාදඩ ආඥාපනත යටතේ අත්අඩංගුවට ගනු ලබන්නේ ඔවුන් මහාමාර්ග හී ගැවෙසෙන බැවිනි. එවැනි නීත්‍යානුකූල නොවන අත්අඩංගුවට ගැනීම් වළක්වා ගැනීම සඳහා 'පාදඩ' යන වචනය පැහැදිලිව නිර්වචනය කළ යුතුය.

පොලිසිය මෙම නීතිමය ප්‍රතිපාදන අනුගමනය නොකරන්නේ නම්, එය නීති විරෝධී අත්අඩංගුවට ගැනීමක් ලෙස සලකනු ලබන අතර, එබැවින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි වගන්තිය උල්ලංඝනය කරනු ඇත.

**මාර්ගෝපදේශ 06: පුද්ගලිකත්වයට ඇති අයිතිය**

අ) සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ පුද්ගලික තොරතුරු රහසිගත තොරතුරු ලෙස සැලකිය යුතුය. සංක්‍රාන්ති සමාජභාවීය තත්ත්වයන් සහ සංවේදී තොරතුරු හෙළිදරව් කිරීම දැනගැනීමට අවශ්‍ය පදනමක් මත විය යුතු අතර ඔවුන් අධිකරණයට ඉදිරිපත් කරන විට අනෙකුත් අත්අඩංගුවේ පසුවන්නන්ට, සාමාන්‍ය ජනතාවට, නීතිඥයින්ට සහ අධිකරණ කාර්ය මණ්ඩලයට එම තොරතුරු හෙළි නොකළ යුතුය.

ආ) සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙකුගෙ ශරීර පරීක්ෂණයක් සිදු කිරීමේදී පොලිස් නිලධාරීන් ඔවුන්ගේ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය හැඳිනගත යුතුය. පිරිමි සිට ගැහැණු ලෙසත් (MTF) ගැහැණු සිට පිරිමි ලෙසත් (FTM) වෙනස් වූ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් පරීක්ෂා කිරීමේදී ඔවුන්ගේ ඉල්ලීම පරිදි සුදුසු පොලිස් නිලධාරියෙකු පත් කළ යුතුය.

**මාර්ගෝපදේශ 07: රැඳවුම් භාරයේ සිටියදී මනුෂ්‍යත්වයෙන් සැලකීමට ඇති අයිතිය**

අ) පොලිස් නිලධාරීන්, වරදක් කළ හෝ වරදක් කළ බවට සැක කෙරෙන සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් පුද්ගලයන් රඳවා තබා ගැනීමේදී ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව සලකා බලා ඔවුන්ට මනුෂ්‍යත්වයෙන් සැලකිය යුතුය.

පිරිමි සිට ගැහැණු බවට පත් සංක්‍රාන්ති සමාජභාවීය රැඳවියන් කාන්තා රැඳවියන් ලෙසත්, ගැහැණු සිට පිරිමි බවට පත් සංක්‍රාන්ති සමාජභාවීය රැඳවියන් පිරිමි රැඳවියන් ලෙසත් සැලකිය යුතුය. හිරිහැර වළක්වා ගැනීම සඳහා සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් අනෙකුත් රැඳවියන්ගෙන් වෙන් වෙන්ව රඳවා තැබිය යුතුය.

ආ) සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙකු කිසිදු හේතුවක් නොමැතිව රඳවා තබා ගන්නේ නම්, එවැනි රඳවා තබා ගැනීම් නීති විරෝධී ලෙස සලකනු ලබන අතර, එය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි වගන්තිය උල්ලංඝනය කිරීමකි. රැඳවුම් ස්ථානයක සිදුවන ඕනෑම ලිංගික හිරිහැරයක්, තර්ජනයක්, බ්ලැක්මේල් කිරීමක්, පහරදීමක් හෝ වධහිංසා කිරීමක්, අමානුෂික, අවමන් සහගත සැලකිල්ලක් ලෙස සලකනු ලැබේ. එබැවින් එය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය උල්ලංඝනය කිරීමකි.

**මාර්ගෝපදේශ 08: පවුල් ජීවිතය භුක්ති විඳීමට ඇති අයිතිය**

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයකදී හෝ පවුලේ සාමාජිකයන් වෙනස් කොට සලකන විටදී, පොලිසිය සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ කායික හා මානසික තත්ත්වය අවබෝධ කරගෙන ඒ අනුව ක්‍රියා කළ යුත්තේ එමගින් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ට තම පවුලේ සාමාජිකයන් නිසා මුහුණ දීමට සිදුවන ගැටලු අවම කළහැකි බැවිනි. සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් මුහුණ දෙන තීරණාත්මක තත්ත්වයන් පවුලේ සාමාජිකයන්ට අවබෝධ කර දීමට පොලිසිය මැදිහත් වී පියවර ගත යුතුය.

**මාර්ගෝපදේශ 09: සංක්‍රාන්ති සමාජභාවීය දරුවෙකුගේ උපරිම යහපත සහතික කිරීම**

පාසල්වල ගුරුවරුන්ගෙන් සහ සෙසු සිසුන්ගෙන් ළමා සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ට සිදුවන හිරිහැර ගැන පැමිණිලි කරන විට හෝ ළමා සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ට එරෙහිව පාසල්වලින් පොලිසියට පැමිණිලි ලැබුණු විට, පොලිස් ස්ථානවල කාන්තා හා ළමා කාර්යංශය වැඩි අවධානයක් යොමු කර උපරිම උනන්දුවෙන් දරුවාගේ සුබසාධනය උදෙසා ක්‍රියා කළ යුතුය. අවශ්‍ය නම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ (NCPA) සහය ලබා ගැනීමට පොලිසිය කටයුතු කළ යුතුය.

**මාර්ගෝපදේශ 10: නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් වෙත ප්‍රවේශ වීමේ අයිතිය**

සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් පුද්ගලයන්ට බියෙන් හෝ හිරිහැරයකින් තොරව ආත්ම විශ්වාසයෙන් පැමිණිලි කිරීමට පොලිසිය ඉඩ ලබා දිය යුතු අතර ඔවුන් පැමිණිලි කරන විට ප්‍රතික්ෂේප කිරීම හෝ වාචිකව අපයෝජනය කිරීම හෝ තර්ජනය කිරීම නොකළ යුතුය. ඊට අමතරව සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන්ගේ පුද්ගලික තොරතුරු අවභාවිත නොකළ යුතුය.

**මාර්ගෝපදේශය 11: අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, සමාගමේ අයිතිය සහ සාමකාමී ව රැස්වීම සඳහා ඇති අයිතිය**

සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට, සමාගමේ අයිතිය සහ සාමකාමීව රැස්වීමට ඇති අයිතිය පොලිසිය සහතික කළ යුතුය. මෙය පොලිස් නිලධාරීන් විසින් පිළිනොපදී නම් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිය උල්ලංඝනය කිරීමකි.

**මාර්ගෝපදේශ 12: LGBTIQ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ අයිතිය**

LGBTIQ පුද්ගලයින්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කරන මානව හිමිකම් ආරක්ෂකයින් අතිශයින් අවදානමට ලක්විය හැකි කණ්ඩායමක් වන අතර නිතර හිංසා සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සඳහා ඉලක්ක වේ. පොලිසිය LGBTIQ ආරක්ෂකයින්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම් හඳුනා ගත යුතු අතර LGBTIQ ප්‍රජාවගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සාමකාමී පරිසරයක් සහතික කළ යුතුය.